

# GSP+ සහ ශ්‍රී ලංකාව

2017 ජනවාරි

DEMOCRACY
REPORTING
INTERNATIONAL



# GSP+ යනු?

යුරෝපා සංගමයේ වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP) යනු යුරෝපා සංගමය වෙත සිය නිෂ්පාදන අපනයනය කරන සංවර්ධනය වෙමින් පවතින රටවලට, එම අපනයන වෙනුවෙන් තීරුබදු මුළුමනින්ම නොගෙවා සිටීමට හෝ අවමයක් ගෙවීමට පහසුකම් සපයන වෙළෙඳ විධික්‍රමය යි. යුරෝපා සංගමය මෙම GSP සහන ක්‍රමය පිරිනැමීමෙන් බලාපොරොත්තු වන්නේ අනතුරුදායක මට්ටමේ (Vulnerable) පවතින රටවල දුගී බව අවම කිරීම, පාලන තත්වය යහපත් කිරීම සහ තිරසාර සංවර්ධනය ඇතිකිරීම සඳහා සහාය වීම යි.

GSP සහන ක්‍රමයෙහිම එක් විශේෂ උපාංගයක් වන ගුණාත්මක සංවර්ධනය සහ යහපාලනය දිරිගැන්වීම සඳහා වන වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) 2005 වසරේදී ලංකාවට හඳුන්වා දෙනු ලැබිණි. එය GSP සහනය ලබන සංවර්ධනය වෙමින් පවතින රටවලටම වෙළෙඳ දිරි දීමනා ලබාදෙන්නාවූ අතිරේක උපාංගයකි. යුරෝපා සංගමය GSP+ හඳුන්වා දෙනු ලැබුවේ ප්‍රතිලාභී රටවලට ප්‍රාමාණික GSP සහන ක්‍රමයෙන් ලැබෙනවාට වඩා පුළුල් වෙළෙඳපොළ පිවිසුමක් ලබා දීමේ ඉලක්කය ඇතුව ය. ඒ වෙනුවෙන් යුරෝපා සංගමය ප්‍රතිලාභී රටවල 7200කට වඩා වැඩි නිෂ්පාදන වර්ග සඳහා තීරුබදු රහිත යුරෝපා වෙළෙඳපොළ පිවිසුම ලබා දුන්නේ ය.

මෙම ප්‍රතිලාභ වෙනුවෙන් ප්‍රතිලාභිත රටවල් සිය රට තුළ මානව හිමිකම්, කම්කරු අයිතීන්, පාරිසරික සහ යහපාලනය සම්බන්ධව පවතින ප්‍රධාන ජාත්‍යන්තර ගිවිසුම් වලංගු කිරීම සහ සාධනීය ලෙස ක්‍රියාත්මක කිරීම කළ යුතු වේ. 2014 දී සංශෝධනය කරන ලදුව, GSP+ දැන් දැඩි අධීක්ෂණ ක්‍රියාවලියක් අනුගමනය කරන අතර එකී ක්‍රියාවලියට සිවිල් සමාජ කාර්යභාරයද ඇතුළු කර තිබේ. වැඩසටහනට නිරීක්ෂකයන් වශයෙන් රාජ්‍ය නොවන ක්‍රියාකරකයන් එකතුකිරීම නිසා අධීක්ෂණ යාන්ත්‍රණය වඩාත් විනිවිද භාවයෙන් යුතුව සහ විෂයබද්ධව ඉදිරිපත් කිරීමට හැකියාව ලැබී තිබේ.

# GSP+ කොන්දේසි

GSP+ සහනය ලබාගැනීමට කැමති රටවල් ඒ සඳහා ඇතුළත්වීම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසි සපුරන බව ඔප්පු කළ යුතු ය.[1]

- අදාළ රාජ්‍යය අවශ්‍යයෙන්ම "අනතුරුදායක මට්ටමේ" (Vulnerable) පැවතිය යුතු ය. එනම්, ලෝක බැංකුව අනුක්‍රමික වසර තුනක කාලයක් තුළ එම රාජ්‍යය ඉහළ ආදායම් හෝ ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් ලෙස වර්ග කර නොතිබිය යුතු ය. වෙනත් වචනයෙන් කිවහොත් එය ප්‍රාමාණික GSP ප්‍රතිලාභියෙකු විය යුතු ය.

- යුරෝපා සංගමය අදාළ රාජ්‍යයෙන් කරන ආනයනයන් නිෂ්පාදන කීපයකට පමණක් සීමා විය යුතු ය. (යුරෝපා සංගමය එම රාජ්‍යයෙන් කරන GSP ආවරණිත ප්‍රධාන ආනයන වර්ග හතෙහි වටිනාකම GSP ආවරණිත මුළු ආනයනවල වටිනාකමින් 75%ක් ප්‍රමාණයක් නියෝජනය කළ යුතු ය). එමෙන්ම එම රාජ්‍යය යුරෝපා සංගමය වෙත කෙරෙන ආනයන ප්‍රමාණය අවශ්‍යයෙන්ම අවම මට්ටමක පැවතිය යුතු ය. (අදාළ රාජ්‍යයෙන් යුරෝපා සංගමය වෙත කෙරෙන GSP ආවරණිත ආනයන ප්‍රමාණය, යුරෝපා සංගමය සිය මුලු ප්‍රතිලාභිතයින්ගෙන් ලබන GSP ආවරණිත මුලු ආනයන ප්‍රමාණයේ වටිනාකමින් 2%කට වඩා අඩු විය යුතු ය).

- අදාළ රාජ්‍යය අවශ්‍යයෙන්ම මානව හිමිකම්, කම්කරු අයිතීන්, පාරිසරික ආරක්ෂාව සහ යහ පාලනය පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුම් 27ක් සිය රට තුළ වලංගුභාවයට පත් කළ යුතු අතර එකී ගිවිසුම් වලින් තහනම් කළ කිසිවක් කිරීමෙන් හෝ එහි එන අරමුණු හා අභිමතාර්ථවලට පරස්පර විරෝධී ලෙස ක්‍රියාකිරීමෙන් තොර ව ඒවා සාධනීය ලෙස ක්‍රියාත්මක කළ යුතු ය.

- අදාළ රාජ්‍යය එකී ගිවිසුම් මගින් ආරෝපණය කර ඇති අවශ්‍යතාවලට සහ අධීක්ෂණ ක්‍රියාවලියට මෙන්ම, යුරෝපා කොමිසමේ මග පෙන්වීම මත යුරෝපා සංගමය විසින් GSP+ කෙරෙහි දී ඇති අධීක්ෂණ ක්‍රියාවලියටද අවනත විය යුතු ය.



# GSP+ සඳහා අයදුම් කිරීම

යම් රාජ්‍යයක් GSP+ සඳහා අයදුම් කළ විට එය මාස දහයක් පමණ ගතවන අපර ක්‍රියාවලියකට බඳුන් වේ. අයදුම් පත පරීක්ෂා කිරීමටත් එය නියමිත මූලික අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්තේ නම් GSP+ වරණය ලබාදීමට යෝජනා කිරීමටත් යුරෝපා කොමිසම මාස හයක පමණ කාලයක් වැය කර යි. යුරෝපා සංගමයේ උපදේශක සභාව සහ යුරෝපා පාර්ලිමේන්තු කොමිසම විසින් ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳ සළකා බැලීමට වෙන් වෙන් වශයෙන් මාස දෙකක කාලයක් ලබා ගනී.[2]

- යම් රාජ්‍යයක් GSP+ හා එක්වීමට අවසර ඉල්ලා සිටියි.

- අයදුම් පත පරීක්ෂා කරන යුරෝපා කොමිසම එය සාධනීය මට්ටමක පවතී නම් ප්‍රවේශය සඳහා යෝජනා කර යි.

- යුරෝපා සංගමයේ පාර්ලිමේන්තුව සහ උපදේශන සභාව විසින් කොමිසමේ යෝජනාව විමර්ශනය කර ප්‍රවේශය පිළිබඳ අවසන් තීරණයට එළඹෙයි.

# නිරීක්ෂණ ක්‍රියාවලිය

යම් රාජ්‍යයක් GSP+ ප්‍රතිලාභිතයෙක් වූ විට එකී රාජ්‍යය වසර දෙකක කාලයක් පුරා චක්‍රාකාරව කෙරෙන නිරීක්ෂණ ක්‍රියාවලියකට බඳුන් වේ. මෙම ක්‍රියාවලියට එකිනෙක සබැඳි උපාංග දෙකක් එක් වේ. එනම් ලකුණු පත්‍රිකාව සහ අධීක්ෂණ ආයතන සමඟ පවත්වාගෙන යන සංවාදය යි.

| ලකුණු පත්‍රිකාව | GSP+ සංවාදය |
|---|---|
| ජාත්‍යන්තර අධීක්ෂක මඬුල්ල විසින් ගිවිසුම් 27 තුළ හඳුනාගත් අඩුලුහුඬුකම් පිළිබඳ තොරතුරු හුවමාරු කරගැනීමේ ක්‍රියාවලිය "ලකුණු පත්‍රිකාව" නම් වේ. යුරෝපා කොමිසම විසින් ප්‍රතිලාභිත රාජ්‍යයක් GSP+ හා එක් වූ විට එම රාජ්‍යය GSP+ වගකීම් හා එක්වීම පිළිබඳ තක්සේරුවකට එකඟ වෙනු ලැබේ (පළමු ලකුණු පත්‍රිකාව).<br><br>ලකුණු පත්‍රිකාවේ ඇති ගැටළු ලේඛනය වාර්ෂිකව යාවත්කාලීන වන අතර, 1) ගිවිසුම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම හා 2) GSP+ සංවාදයේදී හඳුනා ගන්නා අඩුලුහුඬුකම් නිරාකරණය කිරීම සඳහා අදාළ රාජ්‍ය මගින් ගනු ලබන අවංක උත්සාහය යන කරුණු පිළිබඳව අවධානය යොමු කෙරේ. | අන්‍යොන්‍ය විශ්වාසය සහ සහයෝගීතාව මත පදනම්ව, මෙතෙක් ලබා ගත් ප්‍රගතිය සහ ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම සහ අඩුලුහුඬුකම් නිරාකරණය කර ගැනීම මූලික කොටගෙන යුරෝපා සංගමය සහ ප්‍රතිලාභිත රටවල් අතර ඇතිවන සමීප සම්බන්ධතාව "සංවාදය" නම් වේ. ජාත්‍යන්තර ගිවිසුම් වල නිරීක්ෂණ මඬුලු වලට එහා ගිය සිවිල් සමාජය, දේශීය හෝ කලාපීය ප්‍රජාපාලනාධිකාරී, වෙළෙඳ එමෙන්ම මානව හිමිකම් හා කම්කරු අයිතීන් පිළිබඳ සංවිධාන, ආදී ලෙස වන පුළුල් පරාසයක පැතිරුණු මූලාශ්‍ර භාවිත කිරීමට ඇති හැකියාව මෙම සංවාද වල ඇති විශේෂත්වය යි. මෙම සංවාදය දේශීය, කලාපීය හා මධ්‍යම අධිකාරීන්ට සිය වගකීම් ඉෂ්ට කරගැනීම සඳහා සහාය වන දේශීය ක්‍රියාකාරකයන්ගේ ආධාරක භූමිකාව වර්ධනයට හේතු වෙයි. |



# ශ්‍රී ලංකාව: GSP+ අත්පත් කරගැනීම සහ අහිමි කරගැනීම

යුරෝපා සංගමයේ ප්‍රාමාණික GSP ක්‍රමයේ ආරම්භයේ සිටම ශ්‍රී ලංකාව එහි ප්‍රතිලාභිතයෙක් වූ අතර 2005 ජූලි මස 15 වනදා සිට GSP+ සහනයටද ලංකාව හිමිකම් කීවේ ය. නමුත් 2010 අගෝස්තු 15 වනදා සිට යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවේ GSP+ තත්වය අත්හිටවනු ලැබුණි. මෙම තීරණයට මූලිකව හේතු වූයේ කොමිසමේ විමර්ශනයක ප්‍රතිඵලයක් ලෙස හෙළි වූ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ ගිවිසුම් තුනක් ක්‍රියාවට නැංවීමේදී සිදුව ඇති අඩුලුහුඩුකම් වන අතර ඒවා සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR), හිංසාවන් සහ අනෙකුත් කුරිරුකම්, මානසික හෝ නොහොබිනා සැළකීම් හෝ දඬුවම් කිරීම් පිටුදැකීමේ සම්මුතිය (CAT) සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRC) නම් වේ.[3]

# ශ්‍රී ලාංකීය ආර්ථිකය කෙරෙහි GSP+ බලපෑම

මෑතකදී GSP+ සහනය ලබන රටවල් පිළිබඳ කළ විශ්ලේෂණයකට අනුව පැහැදිලි වූයේ රට තුළ ක්‍රියාත්මක වූ කෙටි කාලය තුළ පවා GSP+ සහනයේ ප්‍රතිලාභ විශාල වශයෙන් ලබාගත් රටවල් අතර ලංකාවද සිටින බව යි.[4] සැබවින්ම GSP+ නිසා ලංකාවේ ඇති වූ විශාල ආර්ථික බලපෑම පැහැදිලිව පෙනේ. ශ්‍රී ලංකාව GSP+ සහනය ලද පළමු වසර තුළ උතුරු ඇමෙරිකානු වෙළෙඳ කලාපය (NAFTA) අබිබවා යුරෝපා සංගමය (EU) රටේ විශාලතම අපනයන වෙළෙඳපොළ ලෙස ප්‍රතිස්ථාපනය කරනු ලැබුණි.[5] ඇමෙරිකා එක්සත් ජනපද වෙළෙඳපොළ ආර්ථික අර්බුදය අවස්ථාවේදී යුරෝපා වෙළෙඳපොළ සමඟ වර්ධනය වෙමින් පැවති සම්බන්ධතා ශ්‍රී ලංකාව කෙරෙහි තීරණාත්මක විය. ඇමෙරිකානු අර්බුදය හේතුවෙන් ලංකාව ඇතැම් අලාභ වලට මුහුණ දුන්නද, එහි ආර්ථිකය නම්‍යශීලී ලෙසම පැවතුණි.

**රූප සටහන 1:**
**ශ්‍රී ලංකාවේ අපනයන - 2015**




මූලාශ්‍රය: යුරෝපා කොමිසම

## රූප සටහන 2: යුරෝපා සංගමය වෙත කෙරෙන ශ්‍රී ලාංකීය අපනයන




මූලාශ්‍රය: යුරෝපා කොමිසම:සංඛ්‍යා ලේඛන කාර්යාංශය

GSP+ සහනය අහිමි වීමෙන් පසුවද යුරෝපා සංගමය වෙත ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයනය නොකඩවා සිදු වුණු නමුත් (දෙවැනි රූප සටහන බලන්න) වර්ධන අනුපාතිකය පහළ වැටිණි (තෙවැනි රූප සටහන බලන්න). GSP+ සහනය තිබුණු කාලයේ යුරෝපීය කලාපය වෙත කෙරුණු ශ්‍රී ලංකීය අපනයන කොටස් ප්‍රමාණය 28%-39% තෙක් නොනැවතී වර්ධනය විය. 2004 වසරේ දී (GSP+ හඳුන්වාදීමට පෙර වසර) ලංකාවෙන් යුරෝපා සංගමය වෙත කෙරුණු අපනයන වල වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 1.8 ක් වූ අතර එය 2009 වසර (GSP+ අහිමි කිරීමට පෙර වසර) තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන 2.9 ක් දක්වා වර්ධනය විය.[6]

GSP වලට පෙර ලංකාවේ (2001-2004) වාර්ෂික අපනයන වර්ධන සාමාන්‍යය 11.5% කි.[7] GSP+ කාල සීමාව (2005-2009) තුළ එය 16.4% දක්වා වර්ධනය විය. GSP+ අහිමි වීමෙන් පසු එම තත්වය නැවත පහළ බැස අතර 2010-2014 කාල සීමාව පුරාම 7.4%හි රැඳී පැවතුණි (තෙවැනි රූප සටහන බලන්න).

## රූප සටහන 3: යුරෝපා සංගමය වෙත කෙරුණු අපනයන වල වාර්ෂික වර්ධන සාමාන්‍යය




මූලාශ්‍ර: ෆීලික්ස් ඒ. ෆර්නෑන්ඩු. "GSP+ අත්හිටවූ පසු ඇඟලුම් නිෂ්පාදකයෙකු මුහුණ දුන් දුෂ්කරතා", GSP+ පිළිබඳ සම්මන්ත්‍රණයකදී, ශ්‍රී ලංකාවේ යුරෝපා වාණිජ මණ්ඩලය (ECCSL)

ගණනය කර ඇති ආකාරයට දළ වශයෙන් යුරෝපා සංගමය වෙත අපනයනය කෙරෙන ශ්‍රී ලාංකීය නිෂ්පාදන වලින් 60% ක්ම ඇඟලුම් නිෂ්පාදන වන අතර එම ප්‍රමාණය දේශීය අපනයන නිෂ්පාදන ප්‍රතිශතයෙන් 40% ක් වේ (04 වැනි රූපසටහන බලන්න). ඒ අනුව ඇඟලුම් අපනයන කර්මාන්තය, GSP+ හි වත්මන් තත්වයෙන් වැඩි වශයෙන්ම බැට කන ක්ෂේත්‍රය වශයෙන් දැක්විය හැකිය.[8] ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයට (Institute of Policy Studies-IPS) අනුව, යුරෝපා සංගමය 2008 වසරේ සිට ශ්‍රී ලාංකීය ඇඟලුම් ආනයනය කරමින් ලාංකීය ඇඟළුම් ක්ෂේත්‍රය තුළ විශාලතම වෙළෙඳපොළ බවට පත්වූයේ GSP+ හි බලපෑම හේතුවෙනි.[9]

**රූප සටහන 4: 2015 වසර තුළ ශ්‍රී ලාංකාවෙන් යුරෝපා සංගමය වෙත කෙරෑ අපනයන ප්‍රතිශත වශයෙන්**




මූලාශ්‍රය: යුරෝපා කොමිසම

GSP+ ලැබීමට පෙර සිටම ශ්‍රී ලංකාව ප්‍රාමාණිත GSP (Standard GSP) යටතේ යුරෝපා සංගමය වෙත යැවෙන අපනයන අතරින් බහුතරයක් වෙනුවෙන් වරණිත තීරුබදු අනුපාතික භුක්ති වින්දේ ප්‍රාමාණිත GSP (Standard GSP) යටතේ ය. කෙසේ නමුත් ශ්‍රී ලංකාව ප්‍රාමාණිත GSP (Standard GSP) හරහා පුළුල් පරාසයක ඇති නිෂ්පාදන බොහොමයක් සඳහා අවම තීරු බදු අනුපාතික ලබාගනිද්දී GSP+ මෙම බොහෝ නිෂ්පාදන වලින් තීරු බදු මුළුමනින්ම ඉවත් කළ අතර එමගින් නිෂ්පාදන සඳහා වඩා වැඩි ආවරණයක් (සංවේදී නිෂ්පාදනද ඇතුළත්ව) ලබා දුනි.[10] උදාහරණයක් වශයෙන්, 2008 සහ 2010 අතර කාලය තුළදී යුරෝපා සංගමය වෙත කෙරුණු මුලු ලාංකීය අපනයන ප්‍රමාණයෙන් 29%කටම ප්‍රාමාණිත GSP සහ GSP+ යටතේ සමාන තීරු බදු අනුපාතිකයන් භුක්ති විඳීමට හැකියාව ලැබුණි. කෙසේ නමුත් මෙම කාල වකවානුව අතර බදු සහන ක්‍රම දෙක අතරම දළ වශයෙන් 5%-10% අතර වෙනසක් පැවතුණි.[11]

GSP+ හඳුන්වා දීමෙන් පසුව තීරු බදු අනුපාතික අතර විශාල වෙනසක් පවතිද්දී ද ලංකාවේ වෙළෙඳ වරණ භාවිතය සැළකිය යුතු ප්‍රමාණයකින් වර්ධනය වූ අතර භාවිත අනුපාතිකය 2003 වසරේ 42% සිට 2008 වසරේ 72% දක්වා ඉහළ ගියේ ය.[12] 2010 GSP+ අත් සිටුවීමත් සමඟ නැවතත් මෙම බදු වරණ භාවිතය හීන වූයේ ය.[13] ඇතැම් විශ්ලේෂකයන් මෙම GSP යටතේ වූ අවම භාවිතය එහි ප්‍රභව ස්ථාන නීති (Rules of Origin) වල ඇති අභියෝගී ස්වරූපයට ආරෝපණය කළහ.[14] එනම් ප්‍රභව ස්ථාන නීති (Rules of Origin) මගින් අපනයන නිෂ්පාදිතයට එකතු කළ ඉහළ පිරිවැය හේතුවෙන් බොහෝ ලාංකීය ව්‍යාපාර මෙම අවශ්‍යතා වලට අනුකූල වීමට වැය වන පිරිවැය GSP සහනයෙන් ලැබෙන වාසියට වඩා වැඩි බවට ගණනය කළහ.



# GSP+ නැවත ලබා ගැනීම සහ පවත්වා ගැනීම

මෑතකදී ශ්‍රී ලංකාවේ යුරෝපා සංගම් තානාපති ලංකාව යළි GSP වැඩසටහන හා එක්වීම පිළිබඳව සුබවාදී අදහස් ප්‍රකාශ කළ අතර එම ප්‍රකාශයට මූලික වූයේ ශ්‍රී ලංකාව පසුගිය වසරක කාලය තුළ GSP+ කොන්දේසි සම්පූර්ණ කිරීම සම්බන්ධව පෙන්නුම් කළ ප්‍රගතිය යි.[15] GSP+ පිරිනැමීමත් සමඟම අදාළ රාජ්‍යය විසින් ක්‍රියාත්මක කළ යුතු ගිවිසුම් සම්බන්ධව රාජ්‍යයේ ඇති සියලුම අඩුලුහුඬුකම් සම්පූර්ණ කළ යුතු යැයි යුරෝපා සංගමය බලාපොරොත්තු නොවේ. ඔවුන් බලාපොරොත්තු වන්නේ අදාළ ප්‍රතිඵලය ලබා ගැනීමට එකී රාජ්‍යය දක්වන පැහැදිලි කැපවීමත් එම ප්‍රතිඵලය කරා නොනවත්වා යන ගමනත් පමණි.[16] නව රජයක් ස්ථාපනය කිරීම පමණක් GSP+ නැවත අයදුම් කිරීමට හේතුවක් නොවන බව පැහැදිලි කළ යුරෝපා සංගම් තානාපතිවරයා GSP+ ලබා දෙන්නේ වැඩසටහනේ අවශ්‍යතාවන් සම්පූර්ණ කරන "අභිප්‍රායී හේතු" පදනම් කරගෙන බව කියා සිටියේ ය.[17] 2014 සංශෝධනයේදී යුරෝපා සංගමය විසින් මෙම අවශ්‍යතා පෙර තිබුණු තරමට වඩා දැඩි කරනු ලැබුණි.



# GSP+ සංශෝධිත කොන්දේසි[18]

1 ප්‍රතිලාභිත රටවල් සහ යුරෝපා කොමිසම අතර අඛණ්ඩ සංවාදයක් පවත්වා ගැනීම සහ සෑම දෙවසරකටම වරක් වාර්තා ලබාගැනීම ලෙස GSP+ වැඩසටහනේ අධීක්ෂණ ක්‍රියාවලිය වර්ධනය කෙරිණි. දැන් යුරෝපා සංගම් කවුන්සිලය යුරෝපා පාර්ලිමේන්තුව සමඟ එක්ව නිරීක්ෂණ කටයුතු මෙහෙයව යි.

2 ප්‍රතිලාභිත රටවල් ඔවුන්ගේ වාර්තාකරණය පිළිබඳ ඇති එකඟතාද ඇතුළුව විශේෂ කොන්දේසි වලින් තොරව ජාත්‍යන්තර අධීක්ෂණ මඬුලු සමඟ එකමුතුව ක්‍රියාකළ යුතු ය.

3 ඉවත් කරගත් යාන්ත්‍රණය වඩාත් අභිප්‍රායී වූවකි. දැන් ජාත්‍යන්තර අධීක්ෂණ මණ්ඩලයේ වාර්තා සම්පූර්ණ කිරීම සඳහා යුරෝපා සංගමය වඩා නිවැරදි තොරතුරු මූලාශ්‍ර භාවිත කරනු ඇත. ඔප්පු කිරීමේ බරද (Burden of the Proof) සංශෝධනය කෙරිණි. ක්‍රියාවට නැංවීමේ ගැටළු සාක්ෂි සහිතව පෙන්වූ විට සාධනීය වාර්තාවක් හරහා එය පැහැදිලි කිරීම ප්‍රතිලාභිත රාජ්‍යයේ කර්යභාරය යි.

# GSP+ තුළ කොටස්කරුවන්ගේ භූමිකාව

GSP+ සංශෝධිත කොන්දේසි වල ප්‍රතිඵලයක් ලෙස දැන් සිවිල් සමාජය, ව්‍යාපාරික ප්‍රජාව සහ දේශීය කොටස්කරුවන්ට ද්විවාර්ෂික වාර්තා සඳහා "තෙවැනි පාර්ශ්ව" මූලාශ්‍ර ලෙස ඉතා වැදගත් භූමිකාවක් රඟ දැක්විය හැකිය. මෙම නානාවිධ වූ කොටස්කරුවන්ට GSP+ ක්‍රියාවලිය සඳහා 1) රාජ්‍ය පාලන අධිකාරිය ගිවිසුම් වලට අවනතව කටයුතු කරන ආකාරය අධීක්ෂණය 2) දියුණු විය හැකි ආකාර පිළිබඳ උපදෙස් දීම හා 3) ශ්‍රී ලාංකීය පොදු ජනතාවගේ දැක්ම පිළිබඳ කතා කරන සංවාදකයෙකු ලෙස ක්‍රියා කිරීම ආදී වශයෙන් දායක විය හැක.

| ක්‍රියාකාරක | අධීක්ෂණය | උපදේශනය | සන්නිවේදනය |
|---|---|---|---|
| සිවිල් සමාජය | ■ බලාපොරොත්තු වූ ආකාරයට ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවේදැයි අධීක්ෂණය කිරීම සහ අනුගමනය කිරීම. | ■ විශේෂිත කණ්ඩායම් වල ගැටළු සහ සැළකිල්ලට බඳුන් වන ක්ෂේත්‍ර මතුකිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී මතුවන අවශ්‍යතා වෙනුවෙන් උපදේශනය. | ■ පත්‍රිකා, සමාජ ජාල සහ පොදු වැඩසටහන් හරහා ප්‍රතිපත්ති යෝජනා වල බලපෑම් පිළිබඳ මහජනතාව සහ තීරකයන් දැනුවත් කිරීම. |
| | ■ ප්‍රතිපත්ති ගැටීම් සහ සාර්ථකත්වය, අඩුලුහුඬුකම් සහ වර්ධනය විය යුතු ක්ෂේත්‍ර පිළිබඳ පිළිබඳ පර්යේෂණය කිරීම. | ■ විකල්ප සහ විසඳුම් වලින් සමන්විත විශේෂිත ප්‍රතිපත්ති යෝජනා වෙනුවෙන් බලධරයන් වෙත තුලනාත්මක ප්‍රවීණතාව සැපයීම. | ■ එක්සත් ජාතීන්ගේ සම්මුති වලට අනුකූල වීම සහ GSP+ සහනය අතර ඇති සම්බන්ධය පිළිබඳ අවබෝධයක් ඇති කිරීම. |

| | | | |
|---|---|---|---|
| | ■ ක්‍රියාවලියේ විනිවිදභාවය, ප්‍රජාතන්ත්‍රවාදීභාවය සහ හවුල්කරණය ඒ ආකාරයෙන් සිදු වෙන්නේදැයි පැහැදිලි කරගැනීම හා ඉහත ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.<br><br>■ GSP+ හරහා ජීවිකා වෘත්තීන් වෙනුවෙන් කිසියම් බලපෑමක් සිදුවේදැයි තහවුරු කරගනු සඳහා ප්‍රතිලාභිතයන් සමග කටයුතු කිරීම. | ■ GSP+ සම්මුති හා සම්බන්ධ ප්‍රධාන ප්‍රතිසංස්කරණ ක්ෂේත්‍ර හඳුනා ගැනීමේ අරමුණින් ව්‍යාපාර, මානව හිමිකම් ක්‍රියාකාරකයින්, වෘත්තිය සමිති, ජනමාධ්‍ය, ස්වාධීන ක්‍රියාධරයන් සහ සෙස්සන් වෙනුවෙන් එක් වේදිකාවක් සැකසීම. | ■ සංධානිත පක්ෂ වල නිරීක්ෂණ හා නිගමන වලින් සමන්විත ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ වාර්තා සහ උචිත ජාත්‍යන්තර වාර්තා සමාජගත කිරීම. |
| ව්‍යාපාරික ප්‍රජාව | ■ ව්‍යාපාරික මෙහෙයුම් වළක්වන බාධක හඳුනා ගැනීම සහ ප්‍රතිපත්ති නැවත ඇති කිරීමේ අවශ්‍යතාව විදහා දැක්වෙන සාක්ෂි සැපයීම.<br><br>■ බලධාරීන් පරිසරය, මානව හිමිකම් සහ කම්කරු අයිතීන් පිළිබඳ ප්‍රතිපත්ති අනුගමනය කිරීම අධීක්ෂණය කිරීම වෙනුවෙන් සිවිල් සමාජය සහ සෙසු සමාජ හවුල්කරුවන් සමග සම්බන්ධීකරණය වීම. | ■ දූෂණය පිටුදැකීම සහ කම්කරු බලකායේ අනිසි භාවිතය වළක්වන විධික්‍රම ආදී වූ ව්‍යාපාර ප්‍රවර්ධනයටත් සම්මුතීන්වලට අනුකූල වීමටත් අවැසි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රජය හා එක්වීම.<br><br>■ උපදේශනය සඳහා වඩා පුළුල් සන්ධානයක් ඇති කිරීම වෙනුවෙන් සිවිල් සමාජය හා එක්ව කටයුතු කිරීම. | ■ GSP+ නිසා නිෂ්පාදන සහ ව්‍යාපාර වලටත් රැකියා අවස්ථා නිර්මාණකරණයටත් ඇති වාසි සහ බලපෑම් පිළිබඳ මහජනතාව සහ බලධාරීන් දැනුවත් කිරීම.<br><br>■ එක්සත් ජාතීන්ගේ ගිවිසුම් හා සම්බන්ධිත ජාතික තලයේ ප්‍රතිපත්ති මාලාවක් හඳුනා ගැනීම සඳහා ව්‍යාපාරික ප්‍රජාව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ මහජනතාව සහ අදාළ බලධාරීන් දැනුවත් කිරීම. |

සිවිල් සමාජය සහ ව්‍යාපාර වලට මෙහි ලා අර්ථවත් භූමිකාවක නියැළෙන්නට හැක්කේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා ලාංකීය බලමණ්ඩල වලට සහාය දීම මගිනි. මෙම භූමිකාවේ පවතින වැදගත්කම සෙසු GSP+ ප්‍රතිලාභිත රාජ්‍ය වල අත්දැකීම් වලින් පැහැදිලි ව ඔප්පු කර තිබේ. ආමේනියා රජය 2014-2016 කාලය තුළ මානව හිමිකම් ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී හා අධීක්ෂණයේදී සිවිල් සමාජයේ සහාය ලබා ගත් අතර දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය යටතේ දූෂණය පිටුදැකීම වෙනුවෙන් ආමේනියානු රජයේ ඇති කැපවීම පෙන්වීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගැනීමට ව්‍යාපාරික ප්‍රජාවේ සහාය ලබා ගැනීම උදාහරණ වශයෙන් දැක්විය හැකිය.[19] එමෙන්ම දැන් ජෝජියානු පාලන අධිකාරීන්ද 2016-2017 මානව හිමිකම් ක්‍රියා සැලැස්ම සකසමින් සිටින්නේ සිවිල් සමාජය හා ඇති කරගත් සමීප සහයෝගීතාව සමගිනි.[20] තවද, පාකිස්තානයේ සිවිල් සමාජ සංවිධාන සහ ව්‍යාපාරික ප්‍රජාවේ නියෝජිතයින් රජය සමඟ බහු පක්ෂ සංවාද සඳහා සහභාගී වීම අරඹා ඇත්තේ GSP+ සහ එහි කොන්දේසි පිළිබඳ සාකච්ඡා කරමින් සාමූහික වශයෙන් ඉදිරියට ගෙන යා හැකි මානව හිමිකම් ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡා කරනු සඳහා ය. (පහසුකම් සැපයීම DRI විසිනි)[21]

GSP+ සහනය ලබන ප්‍රධානතම ප්‍රතිලාභිතයා වශයෙන් ව්‍යාපාරික ප්‍රජාව තුළ වැඩසටහනේ කොන්දේසි ඉෂ්ට කරගැනීමට සහාය දීමේ මූලික ළැදියාවක් පවතී. ඊට අමතරව 1) කර්මාන්ත ශාලා සහ රැකියා ස්ථාන කම්කරු ප්‍රමිතීන් වලට අනුගත වීම සුරක්ෂිත කිරීම මෙන්ම 2) සාමූහික සමාජ වගකීම හරහා රටේ වඩා වර්ධිත මානව හිමිකම් සුරක්ෂිතතාවක් සඳහා දායක වීම මෙන්ම මානව හිමිකම් පිළිබඳ ඉහළ සුරක්ෂිතතාවක් කරා ළඟා වීම සඳහා රජයට බලපෑම් කිරීමට ලාංකීය ව්‍යාපාරික ප්‍රජාවට හැකියාව ඇත. 2010 දී යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකා රජය වෙත GSP+ පවත්වාගෙන යාම පිළිබඳව කොන්දේසි මාලාවක් පැනවූ අවස්ථාවේදී ලාංකීය ව්‍යාපාරික ප්‍රජාව ඒ වෙනුවෙන් ඉදිරිපත් වෙමින් වැදගත් භූමිකාවක් නිරූපණය කළ අතර වඩා වර්ධිත අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමක් වෙත රජය නැවත යොමුකරන ලෙස යුරෝපා සංගමය මෑතකදී යළිත් ව්‍යාපාරික ප්‍රජාවෙන් ඉල්ලා සිටියේ GSP+ පුනස්ථාපනය කිරීම ඉක්මන් කිරීම අරමුණු කරගෙන ය.[22] උදාහරණයක් ලෙස ජාතික කම්කරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ සංශෝධන පිළිබඳ කතිකාවත නැවත ආරම්භ කිරීමේ හෝ රාජකාරි ස්ථාන වල සාමූහික කේවල් කිරීම ඇති කිරීම සඳහා ශ්‍රී ලාංකීය බලධාරීන් සමඟ ක්‍රියාකිරීමේ හැකියාව ව්‍යාපාරික ප්‍රජාව සතු වේ. මෙම ක්‍රියාමාර්ග දෙකම ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ වත්මන් සම්මුතීන්ගෙන් ආවරණය වන ප්‍රධාන ගැටළු ආමන්ත්‍රණය කර යි.[23]

# ආශ්‍රේය


1 යුරෝපා කොමිසම, "යුරෝපා සංගමයේ වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP)", 2014 අප්‍රේල් <http://www.sice.oas.org/TPD/GSP/Sources/EU_GSP_04_2014_e.pdf>

2 යුරෝපා කොමිසම, "වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP)", 2013 දෙසැම්බර් 30 <http://trade.ec.europa.eu/doclib/press/index.cfm?id=1006>

3 සම්මුතිය ක්‍රියාවට නැංවීමේ නෛතික සහ ආයතනික අඩුපාඩු, මානව හිමිකම් ආයතන වල, ස්වාධීන කොමිසම් වල දුර්වලකම් සහ සිවිල් සහ දේශපාලනික අයිතීන් පිළිබඳ නෛතික නොවූ සීමාකිරීම් කොමිසමේ විමර්ශන මගින් හඳුනා ගැණිනි. යුරෝපීය ප්‍රජාවේ කොමිසම බලන්න. "ශ්‍රී ලංකාව තුළ ඇතැම් මානව හිමිකම් සම්මුතීන් සාධනීයව ක්‍රියාත්මක කිරීමට අනුකූලව කළ විමර්ශන ප්‍රතිඵල මත පදනම්ව කෙරුණු වාර්තාව" <http://trade.ec.europa.eu/doclib/docs/2009/october/tradoc_145152.pdf>

4 බොන්පාස් ඔන්ගුග්ලෝ, "යුරෝපා සංගමයේ GSP වැඩසටහන සංවර්ධනය වෙමින් පවතින රටවල වාණිජ කර්මාන්තය නගා සිටුවීම සඳහා යොදා ගත හැකි ප්‍රධානතම උපාංගයකි. ලෝක ආර්ථික අර්බුද අවස්ථාවක එය විශේෂිත ය.", වෙළෙඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණය 2010, <http://trade.ec.europa.eu/doclib/docs/2010/march/tradoc_145917.pdf>

5 ඩී.ටී. කිංස්ලි බර්නාඩ්, "GSP+ සහනය අත්හිටුවීම: ඉන් ලාංකීය ආර්ථිකයට සහ අපනයනයට ඇති බලපෑම- අපි ආර්ථික කම්පනය සඳහා සූදානම්ද?" අයිලන්ඩ් පුවත්පත, 2010 අගෝස්තු 22 <http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=4997>

6 සුවේන්ද්‍රනී ජයරත්න, "වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය සහ ලාංකීය ආර්ථිකයට එහි බලපෑම", ආර්ථික සමාලෝචනය (2009 ජුනි-ජුලි, <http://dl.nsf.ac.lk/bitstream/handle/1/14234/ER-35%283-4%29-70.pdf?sequence=2>

7 ෆීලික්ස් ඒ ෆර්නෑන්ඩු, GSP+ අත්හිටවූ පසු ඇඟලුම් නිෂ්පාදකයෙකු මුහුණ දුන් දුෂ්කරතා, GSP+ පිළිබඳ සම්මන්ත්‍රණයකදී, ශ්‍රී ලංකාවේ යුරෝපා වාණිජ මණ්ඩලය, (ECCSL)- "ශ්‍රී ලංකාවට GSP+ නැවත ලබා ගත හැකිද?" 2015 මාර්තු 23

8 ශ්‍රී ලංකා අපනයන සංවර්ධන ආයතනය,"විකේන්ද්‍රීය අපනයන කාර්ය සාධනය 2005-2014ල <http://stat. srilankabusiness.com/epi2015/pdf/Pg%28014-019%29-%20Dissag.%20Export%20Performance%202005%20 -%202014.pdf ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා වන යුරෝපා නියෝජිත මණ්ඩලය, වෙළෙඳ <http://eeas. europa.eu/delegations/sri_lanka/eu_sri_lanka/trade_relation/index_en.htm>

9 ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය, "ශ්‍රී ලංකාව: 2008 ආර්ථික රාජ්‍යය", 2008, <http://www.ips.lk/publications/state_of_economy_report.html>

10 මැතිව් ස්නයිඩර්, "GSP සහ සංවර්ධනය: "අන්‍යොන්‍ය පක්ෂපාතිත්වයෙන් තොර සාඵල්‍යය වර්ධනය", ජාත්‍යන්තර නීතිය පිළිබඳ මිචිගන් සංග්‍රහය 33 වෙළුම අංක 4 (2012).

11 පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය සහ විදෙස් සංවර්ධන ආයතනය, "යුරෝපා සංගමයේ වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමයේ වෙනස්කම්: ශ්‍රී ලංකාවට ඇති සම්බන්ධය," කටු වාර්තාව. ලන්ඩනය: විදෙස් සංවර්ධන ආයතනය, 2012, අශානි අබයසේකර සඳහන් කරන ආකාරයට, "GSP+ අත්හිටුවීම සහ ලාංකීය ඇඟළුම් කර්මාන්තය: සම්බන්ධය සහ ඉදිරි මාවත", දකුණු ආසියානු ආර්ථික සඟරාව, වෙළුම 14 අංක 2 (2012). <http://sae.sagepub.com/ content/14/2/293.abstract>

12 දේශාල් ද මැල්, සුවේන්ද්‍රනී ජයරත්න හා දර්ශනී ප්‍රේමරත්න, "ශ්‍රී ලංකාවේ වෙළෙඳ ගිවිසුම් වල උපයෝගීතාව: සංඛ්‍යාන මිනුම් වලට එදිරිව අපනයනකරුවන්ගේ දැක්ම", ආසියා පැසිපික් පර්යේෂණ සහ පුහුණු ජාලයේ වෘත්තිය පර්යේෂණ ලිපි මලාව, අංක 96, 2011 මාර්තු, <http://www.unescap.org/resources/utilization-trade-agreements-sri-lanka-perceptions-exporters-vs-statistical-measurements>.. <http://www. unescap.org/sites/default/files/AWP%20No.%2029.pdf>

13 අබයසේකර, "GSP සහනය ඉවත් කිරීම සහ ඇඟළුම් කර්මාන්තය"

14 ජොසේ ඇන්සන් සහ මාර්ක් බැවෙටා, "ඌණ සංවර්ධිත රටවල ඇඟළුම් සහ රෙදි පිළි කර්මාන්තයෙහි ලා අනයෝන්‍ය පක්ෂපාතීත්වයෙන් තොර සාඵල්‍ය වර්ධනය", 2005 පැට්‍රික් ලෝ, රොබර්ටා පියෙර්මාටිනි සහ ජුර්ගන් රිශ්ටරින් සඳහන් කරන පරිදි, "ජාතික වත්කම් කළමණාකරණ ආයතනයේ (NAMA) අන්‍යොන්‍ය නොවන සාඵල්‍යය ඛාදනය සඳහා බහු පාර්ශ්වීය විසඳුම්"ලෝක වෙළෙඳ සංවිධානය, 2008 මැයි 16 <http://siteresources.worldbank.org/ INTTRADERESEARCH/Resources/544824-1235150721870/ch07_Low_Piermartini_Richtering_Multilateral_ Solutions_to_Erosion_Pref_NAMA.pdf>

15 GSP+ නැවත ලබා ගැනීම සඳහා ලංකාව-Daly", ඩේලි නිව්ස්, 2016 ජනවාරි 25, <http://www.dailynews.lk/?q=2016/01/25/ business/lanka-track-regain-gsp-daly>

16 ශ්‍රී ලංකාව GSP+ ලබාගැනීමේ මාර්ගය තුළ - තවත් අනුකූලතා අවශ්‍ය වේ. "යුරෝපා සංගම් නිලධාරීන්", ඉකොනොමි නෙක්ස්ට්, 2016 ජනවාරි 22 <http://www.economynext.com/Sri_Lanka_on_track_to_get_GSP+,_more_compliance_needed__EU_ officials-3-4058-10.html>

17 "GSP+ නැවත ලබා ගැනීමට නම් ශ්‍රී ලාංකීය ව්‍යාපාරිකයන් මානව හිමිකම් වර්ධනය කිරීම සඳහා එක්විය යුතු ය. යුරෝපා සංගම් තානාපති කියයි." දෙමළ ගාඩියන්

18 යුරෝපා කොමිසම, "යුරෝපා සංගමයේ වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP)", 2014 අප්‍රේල්

19 යුරෝපා කොමිසම, "2014- 2015 කාල සීමාව ආවරණය වන පරිදි ඒකාබද්ධ මාණ්ඩලික කෘත්‍යාධිකාරී ලේඛනය: තිරසාර සංවර්ධනය සහ යහ පාලනය (GSP+) උදෙසා යුරෝපා සංගමයේ විශේෂ දිරි එකඟතාව", 2016 ජනවාරි 28 20, 35-36. 131

20 යුරෝපා කොමිසම, "ඒකාබද්ද මාණ්ඩලික කෘත්‍යාධිකාරී ලේඛනය". 131

21 ඩිමොක්‍රසි රිපෝටින් ඉන්ටනැශනල්, "පාකිස්තානයේ GSP+ කොටස්කරුවන්ගේ සමුළුව", 2016 අප්‍රේල් 22, <http://democracy-reporting.org/?p=1440>

22 "GSP+ නැවත ලබා ගැනීමට නම් ශ්‍රී ලාංකීය ව්‍යාපාරිකයන් මානව හිමිකම් වර්ධනය කිරීම සඳහා එක්විය යුතු ය. යුරෝපා සංගම් තානාපති කියයි." දෙමළ ගාඩියන්

23 නිරීක්ෂණය (CEACR) බලන්න, 2015 දී සම්මත විය, 105 වෙනි ෂබක සැසියේදී පළ කෙරිණි (2016), සංවිධානය වීමේ සහ සාමූහික කේවල් කිරීමේ අයිතිය පිළිබඳ සම්මුතිය, 1949 (අංක 98)- ශ්‍රී ලංකාව (අපරානුමත කිරීම- 1972). <http://www.ilo.org/dyn/normlex/en/f?p=NO RMLEXPUB:12100:0::NO::P12100_INSTRUMENT_ID:312243>

Federal Republic of Germany
Foreign Office

මෙම ප්‍රකාශනය ජර්මානු විදේශ කටයුතු කාර්යාලයේ අනුග්‍රහය සහිතව පළ කරන ලද්දකි. මෙහි අන්තර්ගතය පිළිබඳ පූර්ණ වගකීම ඩිමොක්‍රසි රිපෝර්ටින් ඉන්ටනැශනල් සතු වන අතර ඉන් ජර්මානු විදේශ කටයුතු කාර්යාලයේ දැක්ම නියෝජනය නොකෙරේ.

පිටු අංක 5 ඡායාරූප හිමිකම: වැලෙරි ලවිතුශෙන්කෝ/ Shutterstock.com

## GSP+ සහනය සඳහා අදාළ වන ජාත්‍යන්තර සම්මුතීන් 27

01. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (1966)
International Covenant on Civil and Political Rights (ICCPR)

02. ආර්ථික, සමාජයීය, සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (1966)
International Covenant on Economic Social and Cultural Rights (ESCR)

03. ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය (1989)
Convention on the Rights of the Child (CRC)

04. කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් පිටුදැකීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රඥප්තිය (1979)
Convention on the Elimination of All Forms of Discrimination Against Women (CEDAW)

05. වධහිංසාව සහ සෙසු කෲර, අමානුෂික, අවමන් සහගත සැලකීම්වලට එරෙහි ප්‍රඥප්තිය (1984)
Convention Against Torture and other Cruel, Inhuman or Degrading Treatment or Punishment (CAT)

06. සියලු ආකාරයේ වර්ගවාදී වෙනස්කම් පිටුදැකීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රඥප්තිය (1965)
International Convention on the Elimination of All Forms of Racial Discrimination

07. වාර්ගික සංහාර අපරාධය වැලැක්වීම සහ ඒ සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීම සඳහා වන ප්‍රඥප්තිය (1948)
Convention on the Prevention and Punishment of the Crime of Genocide

08. වෘත්තීය තත්ත්වයන්ට එළැඹීම සඳහා වන අවම වයස සම්බන්ධ ප්‍රඥප්තිය (1973)
Convention concerning Minimum Age for Admission to Employment

09. ළමා ශ්‍රමිකත්වයේ වඩාත්ම දරුණු මුහුණුවර වැලැක්වීමේ සහ ඒවා සම්බන්ධයෙන් ක්ෂණික පිළියම් යෙදීම සම්බන්ධ ප්‍රඥප්තිය (1999)
Convention concerning the Prohibition and Immediate Action for the Elimination of the Worst Forms of Child Labor

10. බලහත්කාරී ලෙස ශ්‍රමය ලබාගැනීම වැලැක්වීමේ ප්‍රඥප්තිය (1957)
Convention concerning the Abolition of Forced Labor

11. අනිවාර්ය ශ්‍රමය හෝ බලහත්කාරී ලෙස ශ්‍රමය ලබාගැනීම වැලැක්වීම පිළිබඳ ප්‍රඥප්තිය (1930)
Convention concerning Forced or Compulsory Labor

12. සමාන වටිනාකම් සහිත ශ්‍රම සැපයීම් සඳහා ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශවයටම සමාන ප්‍රතිලාභ සහතිකකිරීමේ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (1951)
Convention concerning Equal Remuneration of Men and Women Workers for Work of Equal Value

13. රැකියාවන් සහ වෘත්තීය තත්ත්වයන් සම්බන්ධයෙන් පවතින වෙනස්කොට සැලකීම් පිටුදැකීම සම්බන්ධ ප්‍රඥප්තිය (1958)
Convention concerning Discrimination in Respect of Employment and Occupation

14. සමාගමයේ නිදහස සහ සංවිධානගතවීමේ නිදහස ආරක්ෂාකිරීම සඳහා වන ප්‍රඥප්තිය (1948)
Convention concerning Freedom of Association and Protection of the Right to Organize

15. සංවිධානගතවීමේ නිදහස සහ සාමූහික වශයෙන් කේවල්කිරීමේ අයිතිය සම්බන්ධයෙන් අදාළවන මූලධර්ම සහතිකකිරීම සඳහා වන ප්‍රඥප්තිය (1949)
Convention concerning the Application of the Principles of the Right to Organize and to Bargain Collectively

16. වර්ණභේදවාදී හැසිරීමේ අපරාධය වැලැක්වීමේ සහ එවැනි වැරදි සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීම සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රඥප්තිය (1972)
International Convention on the Suppression and Punishment of the Crime of Apartheid

17. ඕසෝන් ස්ථරයට හානි පමුණුවන ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් වන මොන්ට්‍රියල් වෛකල්පිත සන්ධානය (1987)
Montreal Protocol on Substances that deplete the Ozone Layer (Montreal  Protocol)

18. අන්තර්-දේශසීමා අතර අන්තරායකර අපද්‍රව්‍ය එහා මෙහා ගෙනයාම සහ එවැනි අපද්‍රව්‍ය විනාශකිරීම පාලනයකිරීම සම්බන්ධයෙන් වන බේසල් සම්මුතිය (1989)
Basel Convention on the Control of Transboundary Movements of Hazardous Wastes and Their Disposal (Basel Convention)

19. නොනැසෙන ස්වභාවයේ කාබනික පරිසර දූෂ්‍යකාරක සම්බන්ධයෙන්වන ස්ටොක්හෝම් සම්මුතිය (2001)
Stockholm Convention on Persistent Organic Pollutant (Stockholm Convention)

20. අන්තරායන්ට මුහුණපා ඇති වනසත්ව හා ශාක විශේෂ ජාත්‍යන්තරව වෙළඳාම්කිරීම සම්බන්ධයෙන් වන ප්‍රඥප්තිය (1973)
Convention on International Trade in Endangered Species of Wild Fauna and Flora

21. ජෛව විවිධත්වය සම්බන්ධයෙන් වන ප්‍රඥප්තිය (1992)
Convention on Biological Diversity

22. ජෛව ආරක්ෂාව සම්බන්ධයෙන් වන කාර්ටගන් වෛකල්පිත සන්ධානය (2000)
Cartagena Protocol on Biosafety

23. දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ මූලධර්ම සම්මුතියට එක්කරන ලද කියෝටෝ වෛකල්පිත සන්ධානය (1998)
Kyoto Protocol to the United Nations Framework Convention on Climate Change

24. මත්ද්‍රව්‍යමය අගයන් සහිත ඖෂධ සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ ඍජු ප්‍රඥප්තිය (1961)
United Nations Single Convention on Narcotic Drugs

25. මනෝව්‍යාධිකාරක අගයන් සහිත ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (1971)
United Nations Convention on Psychotropic Substances

26. මත්ද්‍රව්‍යමය අගයන් සහිත ඖෂධ සහ මනෝව්‍යාධිකාරක අගයන් සහිත ද්‍රව්‍යයන් නීතියට පටහැනිව වෙළඳාම්කිරීම පිටුදැකීම සඳහා වන එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (1988)
United Nations Convention against Illicit Traffic in Narcotic Drugs and Psychotropic Substances

27. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (2004)
United Nations Convention Against Corruption (Mexico Convention)

DEMOCRACY
REPORTING
INTERNATIONAL

## පිළිබඳ

ඩිමොක්‍රසි රිපෝටින් ඉන්ටනැශනල් (DRI) ප්‍රජාතන්ත්‍රවාදී මාර්ගයේ අතරමැද පවත්නා රටවල් වල පුරවැසියන්ගේ දේශපාලනික සහභාගීත්වය, රාජ්‍ය ආයතන වල වගවීම සහ ප්‍රජාතාන්ත්‍රික ආයතන වල සංවර්ධනය ප්‍රවර්ධනය කර යි. එය GSP+ පිළිබඳ කටයුතු කරන අතලොස්සක ජාත්‍යන්තර ක්‍රියාකාරකයින් පිරිසක් වශයෙන් GSP+ හි කොන්දේසි, මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ ළඟා කරගැනීම උදෙසා භාවිත කර යි. මෙම ව්‍යාපෘතිය GSP+ සහන ක්‍රමය හරහා පුළුල් ශ්‍රී ලාංකික කොටස්කරු සහභාගීත්වයක් ඇති කිරීම මගින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත්ව ස්ථාපනය කිරීමටත් මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමට සන්සන්දනාත්මක ජාත්‍යන්තර අත්දැකීමක් ලබාදීමටත් උත්සාහ දරයි.

Democracy Reporting International gGmbH

Prinzessinnenstraße 30
10969 Berlin, Germany.
T / +49 30 27 87 73 00
F / +49 30 27 87 73 00-10
info@democracy-reporting.org

Sri Lanka Country Office

15/1 Skelton Gardens
Colombo 05, Sri Lanka.
T/ +94 112 50 7619
srilanka@democracy-reporting.org
www.democracy-reporting.org